සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය -2026
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2026

භූගෝල විද්‍යාව I Geography I	22	S	I	කාලය : පැය තුනයි Time : Three hours

විභාග අංකය : .....

අමතර කියවීම් කාලය- මිනිත්තු 10 යි

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 03 කින් සමන්විත වේ.
- I කොටස බහුවරණ ප්‍රශ්න 40කින් යුක්ත වන අතර,ඒ **සියලු ප්‍රශ්න වලට** පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- II කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය.
- III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.
- I කොටස සමග II කොටස හා III කොටසේ පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න

I-කොටස

1.ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති (GPS) තාක්ෂණය භාවිතයෙන් ඇඳෙන සිතියමක සුවිශේෂ ලක්ෂණය වන්නේ

1) පරිගණකයක ගබඩා කරන ලද දත්ත දෘශ්‍යමානව ඉදිරිපත් කිරීම ය.
2) භූමියේ යම් කුඩා ප්‍රදේශයක විවිධ භූගෝලීය ලක්ෂණ පැහැදිලිව ඉදිරිපත් කිරීම ය.
3) ත්‍රිමාන දර්ශනයක් මගින් භූ ලක්ෂණවල නිරපේක්ෂ පිහිටීම නිවැරදි ව දක්වීම ය.
4) භූමියේ ඕනෑම ස්ථානයක නිරපේක්ෂ පිහිටීම නිවැරදිව දැක්වීම ය.
5) භූමියේ භූගෝලීය ලක්ෂණ වල සාපේක්ෂ පිහිටීම විශ්ලේෂණය කිරීමය.

(.....)

2. අන්තර් චාතුර්ථක පරාසයෙහි නිවැරදි අර්ථය වන්නේ ,

1) සම්මත අපගමනය හා මධ්‍යන්‍ය අපගමනය අතර වෙනසය
2) Q3 (ඉහළ චාතුර්ථකය) හා Q1 (පහළ චාතුර්ථකය) අතර වෙනසය.
3) Q3 (ඉහළ චාතුර්ථකය) හා උපරිම අගය අතර වෙනසය
4) මධ්‍යස්ථය හා Q1 (පහළ චාතුර්ථකය) අතර වෙනසය
5) මධ්‍යස්ථය හා Q3 (ඉහළ චාතුර්ථකය) අතර වෙනසය (.....)

3. විශාල පරිමාණීය සිතියමක නියෝජ්‍ය පරිමාණ භාගය දැක්වෙන පිළිතුර වන්නේ ,

1) 1:63360 2) 1:5000 3) 1:50000 4) 1:250000 5) 1:600000 (.....)

Past Papers Wiki

4. විවික්ත දත්ත මගින් දැක්වෙන විචල්‍ය තුනක් නිවැරදිව සඳහන් වන පිළිතුර කුමක්ද ?

1) සංචාරකයින්ගේ පැමිණීම , විල් සංඛ්‍යාව , පවුලේ ළමයින් සංඛ්‍යාව
2) උස , භූමි පරිහරණය , දුර
3) වර්ෂණය , උන්නතාංශ , පාංශු තෙතමනය
4) බර , භූමි පරිහරණය , වාෂ්පීකරණය
5) පාංශු තෙතමනය , වාෂ්පීකරණය , කාලය (.....)

5. ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම් වල හඳුනාගත හැකි ජලවහන ලක්ෂණ තුනක් ඇතුළත් වන්නේ පහත සඳහන් කුමන පිළිතුරෙහි ද ?

1) දිය බෙත්ම , දඹය , වගුර
2) ගං දහරය , මොහොර බැවුම , ජාලාකාර ජලවහනය
3) හැඩපලු ගංගාව , ගංදගරය , සානුව
4) ගංදගරය, දුනු විල, දිය බෙත්ම
5) උල්පත , මෝය , සැදැල් කපොල්ල (.....)

6. ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් වල සමෝච්ච රේඛා මගින් පමණක් පෙන්නුම් කෙරෙන ලක්ෂණ තුනක් සඳහන් වරණය කුමක්ද ?

1) කොත් කන්ද,ගංදගරය , වගුරු බිම
2) මොහොර , උත්තල බෑවුම , ආයත නිම්නය
3) තීර්යක් නිම්නය , ගංගා විලෝපය , පාෂාණ උද්ගතය
4) දිය බෙත්ම , සුළං කපොල්ල , සානුව
5) අවතල බෑවුම , නෙරුව , ගංගා විලෝපය (.....)

7. සම සංඛ්‍යා රේඛා සිතියම් මගින් නිරූපණය කළ හැකි භූගෝලීය ලක්ෂණ දෙකක් වන්නේ,

1) මාර්ග සහ ජලවහනයයි.
2) උන්නතාංශය සහ වර්ෂාපතනයයි.
3) භූමි පරිහරණය සහ ජන ඝනත්වයයි.
4) වන වැස්ම සහ මානව ජනාවාසයි.
5) වී වගා බිම සහ පාංශු වර්ගයි. (.....)

08. කිලෝමීටර දෙකක් දිග මාර්ගයක් සිතියමක දැක්වෙන්නේ සෙන්ටිමීටර 20 කිනි . එම සිතියමෙහි නිවැරදි පරිමාණය කුමක්ද ?

1) 1:5,000 2) 1:10,000 3) 1:20,000 4) 1:40,000 5) 1:100,000 (.....)

09. සිරස් ගුවන් ඡායාරූප ලබා ගැනීමේ දී කැමරාවේ ප්‍රකාශ අක්ෂය පොළවට ලම්බාකාරව පිහිටා තිබීම නිසා ඇතිවන්නා වූ අවාසිදායක තත්ත්වයක් වන්නේ ,

1) ත්‍රිමාණ ලක්ෂණ පැහැදිලි ව නිරූපණය වීම යි.
2) තොරතුරු විශාල ප්‍රමාණයක් අන්තර්ගත වීමයි.
3) තොරතුරු විශ්ලේෂණය අසීරු වීමයි.
4) ලැබෙන තොරතුරු ප්‍රමාණවත් නො වීමයි.
5) ත්‍රිමාණ ලක්ෂණ පැහැදිලිව නිරූපණය නො වීමයි. (.....)

10. ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් වල එකට එකතු කොට ඇති සිතියම් පත්‍ර අංක දෙකක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

1) 81, 82 2) 89, 90 3) 71, 72 4) 51, 52 5) 63, 64 (.....)

11. ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ (UNFCC) පාර්ශවකරුවෙකු වුයේ කුමන වර්ෂයේදී ද ?

1) 1993 2) 1983 3) 1893 4) 1793 5) 2003 (.....)

12. වායු පීඩනය මැනීම සඳහා භාවිතා කරන ඒකකය කුමක්ද ?

1) මිලිමීටර් ය. 2) කිලෝමීටර් ය. 3) මිලිබාර් ය. 4) මිලිලීටර් ය. 5) බැරෝමීටර් ය. (.....)

13. පෘථිවියේ සමස්ත ජල ස්කන්ධය ඝන කිලෝ මීටර් කොපමණ ද ? (යුනෙස්කෝ ආයතනය ගණනය කර ඇති ආකාරය අනුව)

1) ඝන කිලෝ මීටර් මිලියන 1336 පමණ ය. 2) ඝන කිලෝ මීටර් මිලියන 1386 පමණ ය.
3) ඝන කිලෝ මීටර් මිලියන 1683 පමණ ය. 4) ඝන කිලෝ මීටර් මිලියන 1122 පමණ ය.
5) ඝන කිලෝ මීටර් මිලියන 1002 පමණ ය. (.....)

14. පෘථිවියේ භ්‍රමණය හේතුවෙන් නිර්මාණය වන බලය හඳුන්වන්නේ ,

1) කෝරියෝලිස් බලය 2). කේන්ද්‍රාභිසාරී බලය 3) ඝර්ෂණ බලය
4). පීඩන අනුක්‍රමණ බලය 5) ගුරුත්වාකර්ෂණ බලය (.....)

15. කාන්තාර වල ජලයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වන්නේ පහත සඳහන් කවර භූ රූපය ද ?

1) බහාඩා 2) වාමට කැට 3) යාඩැං 4) සොයිගම 5) හමාඩා (.....)

16. උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් අඩුවන වායුගෝලයේ ස්තර දෙක වන්නේ ,

1). පරිවර්ති ගෝලය සහ අපරිවර්ති ගෝලය යි 2). පරිවර්ති මණ්ඩලය සහ අපරිවර්ති මණ්ඩලය යි
3). පරිවර්ති ගෝලය සහ මෙසෝ ගෝලය යි 4). අපරිවර්ති ගෝලය සහ පරිවර්ති මණ්ඩලය යි
5). මෙසෝ ගෝලය සහ අපරිවර්ති මණ්ඩලය යි (.....)

17. එල්නිනෝ (El - Nino) සංසිද්ධිය හට ගන්නේ ,

1). ඉන්දියන් සාගරයේ උෂ්ණත්වය ක්ෂණිකව අඩු වීමෙනි
2). පැසිපික් සාගරයේ උෂ්ණත්වය ක්‍රමිකව අඩු වීමෙනි
3). අත්ලන්තික් සාගරයේ උෂ්ණත්වය ක්‍රමිකව වැඩි වීමෙනි
4). පැසිපික් සාගරයේ උෂ්ණත්වය ක්ෂණිකව වැඩි වීමෙනි.
5). ඉන්දියන් සාගරයේ උෂ්ණත්වය ක්‍රමිකව වැඩි වීමෙනි (.....)

18. ඉහළ යන වායුවක ඝනීභවන මට්ටමට ළඟාවන තෙක් උෂ්ණත්වය ක්‍රමයෙන් අඩු වීම හඳුන්වනු ලබන්නේ ,

1) ස්ථිරතාපි පතනසීග්‍රතාව වශයෙනි. 2) පරිසර පතනසීග්‍රතාව වශයෙනි.
3) තෙත් ස්ථිරතාපි පතනසීග්‍රතාව වශයෙනි. 4) වියළි ස්ථිරතාපි පතනසීග්‍රතාව වශයෙනි.
5) අස්ථායි පතනසීග්‍රතාව වශයෙනි. (.....)

19. ශ්‍රී ලංකාවේ මුළු ගංගා ද්‍රෝණි සංඛ්‍යාව ,

1) 96 2) 98 3) 103 4) 104 5) 106 (.....)

20. ශ්‍රී ලංකාවේ තෙත් පතන තෘණ භූමි පිහිටි ප්‍රදේශ තුනක් දැක්වෙන පිළිතුර කුමක්ද ?

1) හෝර්ටන් තැන්න, මාදුරුඔය, බෝපත්තලාව 2) මාදුරුඔය, බෝපත්තලාව, හග්ගල
3) හෝර්ටන් තැන්න, අඹේවෙල,ආගරපතන 4) බෝපත්තලාව, සමනල කන්ද, යාල
5) හග්ගල, අඹේවෙල, උඩවලව (.....)

21. ගංගා බාදනයේ සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුන වනුයේ ,

1) ඝර්ෂණය, පිනුම් ගමන සහ ද්‍රාව ක්‍රියාවයි. 2) ඝර්ෂණය, පරිවහනය සහ ද්‍රාව ක්‍රියාවයි.
3) ඝර්ෂණය, සංඝර්ෂණය සහ ද්‍රාව ක්‍රියාවයි. 4) ඝර්ෂණය, රූටායාම සහ ද්‍රාව ක්‍රියාවයි.
5) උල්ලේඛය, පිනුම් ගමන සහ ද්‍රාව ක්‍රියාවයි. (.....)

22. ශ්‍රී ලංකාවේ උපරිම වර්ෂාපතනයක් වාර්තා වන ස්ථානය වන්නේ ,

1) යටියන්තොට ය. 2) හැටන් ය. 3) වටවල ය. 4) මාලිබොඩ ය. 5) තලවාකැලේ ය. (.....)

23. ශ්‍රී ලංකාවේ දෙවැනි දිගම ගංගාව වන්නේ ,

1) කළු ගඟ ය. 2) කලා ඔය ය. 3) මල්වතු ඔය ය. 4) කැලණි ගඟ ය. 5) වළවේ ගඟ ය. (.....)

24. පිලිපීන් දූපත් ආශ්‍රිතව නිවර්තන වාසුළි හඳුන්වන්නේ ,

1) ටයිපුන් 2) හරිකේන් 3) සයික්ලෝන් 4) විලිවිලිස් 5) බැගියෝ (.....)

25. කිසියම් වායු ඒකකයක් මඟින් 22°C ක උෂ්ණත්වයකදී අවශෝෂණය කරගෙන ඇති ජලවාෂ්ප ප්‍රමාණය 30g කි . එම උෂ්ණත්වය යටතේ එම වායු ඒකකයට අවශෝෂණය කරගත හැකි ජල වාෂ්ප ප්‍රමාණය 120g කි . එවිට මෙහි සාපේක්ෂ ආර්ද්‍රතාවය කොපමණද ?

1) 25% 2) 40% 3) 50% 4) 55% 5) 60% (.....)

26. පෘථිවියේ අවකාශීය විවිධත්වය අධ්‍යයනය කිරීම භූගෝල විද්‍යාව ලෙස හැඳින්වූයේ,

1) කාල් රිටර් ය. 2) පෙඩ්‍රික් රැට්සල්ය. 3) ඇලෙක්සැන්ඩර් වොන් හබෝල්ට් ය.
4) ඇලන් සෙම්පල් ය. 5) රිචඩ් හාර්ටිෂෝන් ය. (.....)

27." ගෝල්ඩන් බනානා' නමින් හැඳින්වෙන නාගරික - කාර්මික වේදිකාව විහිදීමට ආරම්භ වන ප්‍රදේශය වනුයේ ,

1) චිකාගෝය. 2) බොස්ටන්ය. 3) වයඹ දිග එංගලන්තය. 4) පිනෝවා. 5) ග්ලාස්ගෝය.
(.....)

28. චීනයේ වායු දූෂණය අතින් ඉහළම ස්ථානයේ පසුවන නාගරික ප්‍රදේශ වනුයේ ,
1) සිංපියෑන් හා වුහාන් ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
2) ෂැංහයි හා සැංසි ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
3) බෙයිජිං හා ටියුංජින් ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
4) වුහාන් හා සිංපියෑන් , මැන්චුරි ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය.
5) බෙයිජිං හා සිංජිනියා ආශ්‍රිත නාගරික ප්‍රදේශයන්ය. (.....)

29. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) ස්ථාපිත කර ඇති නගරය කුමක්ද ?
1) ස්පාඤ්ඤයේ මැඩ්‍රිඩ්. 2) ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්. 3) උතුරු ඇමරිකාවේ කැලිෆෝනියාව.
4) ඉන්දියාවේ නව්දිල්ලි නුවර. 5) පෘතුගාලයේ ලිස්බන්. (.....)

30. ලෝකයේ නිෂ්පාදනය කරනු ලබන යපස්වලින් 98% ක්ම යොදාගනු ලබන්නේ ,

1). යකඩ හා වානේ නිෂ්පාදනයට ය. 2) මෝටර් රථ නිෂ්පාදනයට ය. 3) නැව් කර්මාන්තයට ය.
4). විදුලි උපකරණ නිෂ්පාදනයට ය. 5)ගුවන් යානා කර්මාන්තයට ය. (.....)

31. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) දක්වන පරිදි ගෝලීයකරණ ක්‍රියාවලිය සිදුවන මූලික අංශයක් වූයේ කවරක්ද ?

1). වෙළෙඳාම හා ගනුදෙනු කිරීම 2). ආර්ථික 3). සංස්කෘතික
4). දේශපාලනික 5). තාක්ෂණික (.....)

32. ලෝක කෘෂිකාර්මික තාක්ෂණය යටතේ හරිත විප්ලවය මගින් හඳුන්වා දුන් දෙමුහුන් කළ වී බීජ වර්ගයක් වූයේ කවරක්ද ?

1). IR 36 2). BG 407 H 3). රන් සහල් 4). TN 1 5). නොරින් 10 (.....)

33. මාස්ට්‍රිච්ට් (Treaty of Maastricht) සම්මුතිය මගින් ආරම්භ කළ සංවිධානය වන්නේ ,

1) ආසියානු සංගමය 2) යුරෝපා සංගමය 3) සාර්ක් සංවිධානය 4) ඔපෙක් සංවිධානය
5) මාස් ස්ට්‍රිච්ට් සංවිධානය (.....)

34. ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (IRRI) පිහිටි රට,

1) තායිලන්තය 2) පිලිපීනය 3) ඉන්දියාව 4) බංගලාදේශය 5) ප්‍රංශය (.....)

35."කිසියම් භෞතික හෝ සමාජීය හෝ ආර්ථික හෝ බාධකයක් නොපවතින විට ජනාවාස කිසිදු බාධාවකින් තොරව ව්‍යාප්ත වේ." එවැනි ජනාවාසයක් හඳුන්වනුයේ,

1). නිහැඬ ජනාවාසයක් වශයෙනි. 2). සවිධි ජනාවාසයක් වශයෙනි. 3). ආකීර්ණ ජනාවාසයක් වශයෙනි.
4). සැලසුම්ගත ජනාවාසයක් වශයෙනි. 5). විකීර්ණ ජනාවාසයක් වශයෙනි. (.....)

36. ශ්‍රී ලංකාවේ සුපිරි වෙළඳ සැල් ආරම්භ කරන ලද දශකය ලෙස සැලකනුයේ,

1). 1990 දශකය යි 2). 1980 දශකය ය 3). 1950 දශකය ය 4). 1970 දශකය ය 5). 1960 දශකය ය
(.....)

37. ශ්‍රී ලංකාවේ පොස්පේට් හා ඉල්මනයිට් නිෂ්පාදනය කරන ස්ථාන දෙක පිළිවෙලින් දැක්වෙන්නේ,

1). යාපනය හා බේරුවලය 2). නාත්තන්ඩිය හා ඔක්කම්පිටිය 3). කොච්චිකඩේ හා පුත්තලමය
4). එප්පාවල හා පුල්මුඩේය 5). මීටියාගොඩ සහ බෝගලය (.....)

38. "ASEAN" සංවිධානයට අයත් සාමාජික රටවල් හතරක් වන්නේ ,

1). ඉන්දියාව , මාලදිවයින , මැලේසියාව සහ තායිලන්තයයි
2). කාම්බෝජය , මියන්මාරය , පිලිපීනය සහ වියට්නාමයයි
3). සිංගප්පූරුව , ඇෆ්ගනිස්තානය , පකිස්තානය සහ නේපාලයයි
4). ලාඕසය , චීනය , මොංගෝලියාව සහ තායිවානයයි
5). පැපුවා නිව් ගිනියාව , මැලේසියාව , උතුරු කොරියාව සහ බංග්ලාදේශයයි (.....)

39. උක් සීනි නිෂ්පාදනය කරනු ලබන කර්මාන්ත ශාලාවක් ස්ථානගත වීම තීරණය කරන ප්‍රධාන සාධකය කුමක්ද ?

1) උසස් තාක්ෂණය ලබාගත හැකි වීම
2) පුහුණු ශ්‍රමය ලබාගත හැකි වීම
3) මූල්‍ය ප්‍රාග්ධනය ලබාගත හැකි වීම
4) අමුද්‍රව්‍ය ආසන්නව පැවතීම
5) වරායට ආසන්න වීම (.....)

40. ජන සංඛ්‍යාව වියපත් වීමට (Population Ageing) හේතු වන සාධක දෙකක් ඇතුළත් නිවැරදි වරණය කුමක්ද ?

1) ආයු අපේක්ෂාව ඉහළ යාම සහ සාඵල්‍යතාව ඉහළ යාම.
2) ආයු අපේක්ෂාව පහළ යාම සහ මරණ ශීඝ්‍රතාව අඩු වීම.
3) ආයු අපේක්ෂාව ඉහළ යාම සහ සාඵල්‍යතාව පහළ බැසීම.
4) ආයු අපේක්ෂාව පහළ යාම සහ විවාහ ශීඝ්‍රතාව පහළ යාම.
5) ආයු අපේක්ෂාව ඉහළ යාම සහ විවාහ ශීඝ්‍රතාව ඉහළ යාම. (.....)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය -2026
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2026

භූගෝල විද්‍යාව I
Geography I

22 | S | I

උපදෙස් :

- II කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය.
- III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට පමණක්** පිළිතුරු සැපයිය යුතු ය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50000 භූ ලක්ෂණ සිතියමක කොටසක්ද ලෝක ආකෘති සිතියමක්ද සපයනු ලැබේ.

II-කොටස

01.ශ්‍රී ලංකාවේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50000 පරිමාණයේ දඹුල්ල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. සිතියම් ප්‍රදේශයේ උන්නතාංශීය පරාසය දක්වන්න. (ලකුණු. 01)

ii. A - B හා C - D වලින් දැක්වෙන භූ ලක්ෂණ දෙක නම් කරන්න. (ලකුණු. 02)

iii. අංක 01 චතුරස්‍රය දෙගුණයකින් විශාල කර ප්‍රධාන මාර්ගය පමණක් ඇඳ දක්වන්න. (ලකුණු. 03)

iv ඉහත iii හි ඔබ විසින් විශාල කරන ලද සිතියම් කොටසට අදාළ රේඛීය පරිමාණය අඳින්න (ලකුණු. 03)

v. අංක 2 චතුරස්‍රයේ ජනාවාස වර්ගය ද අංක 3 චතුරස්‍රයේ පවතින සංස්කෘතික ලක්ෂණය ද දක්වන්න. (ලකුණු. 02)

vi. A-9 ප්‍රධාන මාර්ගයේ සැබෑ දිග සොයන්න. (ලකුණු. 02)

vii. සිතියම් ප්‍රදේශයේ බටහිර අර්ධයේ හා නැගෙනහිර අර්ධයේ මානුෂ කටයුතු ව්‍යාප්තියේ වෙනස්කම් වලට බලපාන සාධක සාකච්ඡා කරන්න. (ලකුණු. 03)

viii. ප්‍රදේශයේ භූ විෂමතාවය හා ජලවහනය මෙම ප්‍රදේශයේ භූමි පරිභෝගය සඳහා බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු. 04)

02. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

- වික්ටෝරියා විල
- එට්නා ගිණිකන්ද
- අඟුල්හාස් දියවැල
- කර්කටක නිවර්තන රේඛාව
- මිසිසිපි ගඟ
- හෝමුස් සමුද්‍ර සන්ධිය
- මහා බාධක කඳුවැටිය
- ලෝක අර්තාපල් පර්යේෂණ ආයතනය පිහිටි නගරය
- COPE-30 සමුළුව පැවැත්වූ රට
- සාර්ක් සමුළුව ආරම්භ කළ නගරය (ලකුණු 1 x10=10යි)

I I I-කොටස

03.

i. දුරස්ථ සංවේදය යනු කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

ii. දුරස්ථ සංවේදයේදී දත්ත රැස්කරන දුරස්ථ සංවේද වේදිකා නම් කර එක් උදාහරණය බැගින් ලියන්න (ලකුණු 03 යි)

iii. භූගෝලීය තොරතුරු පද්ධතිය(G.I.S) තුළ දෛශික සිතියමක් අංකිත සිතියමක් බවට පත්කරන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iv. නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමවේද වල අවාසි තුනක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න (ලකුණු 05යි)

04.

i. දත්ත හා තොරතුරු අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 03 යි)

ii. සන්තතික දත්ත සහ විවික්ත දත්ත අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04 යි)

iii. කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් දෙකක් සහ අපකිරණ මිනුම් දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)

iv. ද්විමිතිකික දත්ත මූලාශ්‍ර රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස අන්තර්ජාලයේ වාසි සහ අවාසි සන්සන්දනාත්මකව පැහැදිලි කරන්න (ලකුණු 06 යි)

PAST PAPERS WIKI

05.

i. පහත වගු අංක 01 හි සඳහන් දත්ත සඳහා ද්විත්ව තීරු ප්‍රස්තාරයක් අඳින්න (ලකුණු 08 යි)

වගු අංක 01- ශ්‍රී ලංකාවේ සංගණන වසර කිහිපයක ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාක්ෂරතා ප්‍රතිශතය

වර්ශය	1963	1971	1981	2001	2012
පුරුෂ	85.8	85.6	91.1	92.6	96.9
ස්ත්‍රී	67.5	70.9	83.2	89.7	94.6

මූලාශ්‍රය-ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ii. ඔබ ඉහත i හි නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ සංගණන වසර කිහිපයක ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාක්ෂරතා ප්‍රතිශතයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

iii. ද්විත්ව තීරු ප්‍රස්තාරයේ වාසි හා අවාසි දෙක බැගින් පැහැදිලි කරන්න (ලකුණු 04 යි)

06. වගු අංක 02 හි සඳහන් දත්ත භාවිතා කරමින් පහත සඳහන් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න

වගු අංක 02- එක්තරා පන්තියක සිසුන් 25 දෙනෙකු භූගෝලවිද්‍යා විෂය සඳහා ලබාගත් ලකුණු

	42	69	75	82	49	55	80	73	62	66	50	77
40	58	43	71	38	44	83	73	70	45	85	52	59

i. ඉහත වගු අංක 02 හි සඳහන් දත්ත භාවිතයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න

(A) මධ්‍යස්ථය

(B) පළමු චාතුර්ථකය

(C) තුන්වන චාතුර්ථකය

(D) අන්තර් චාතුර්ථක පරාසය (1.5×4) (ලකුණු 06 යි)

ii. ඉහත වගු අංක 02හි සඳහන් දත්ත භාවිතයෙන් විසරණ සටහනක් නිර්මාණය කරන්න (ලකුණු 06 යි)

iii. ඔබ නිර්මාණය කරන ලද විසරණ සටහන මගින් දැක්වෙන සිසුන් 25 දෙනාගේ භූගෝලවිද්‍යා විෂය සඳහා ලබාගත් ලකුණුවල කැපීපෙනෙන ලක්ෂණ 03ක් සඳහන් කරන්න (ලකුණු 03 යි)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය -2026
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2026

භූගෝල විද්‍යාව II Geography II	22	S	II	කාලය : පැය තුනයි Time : Three hours

අමතර කියවීම් කාලය- මිනිත්තු 10 යි

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ.
- අවම විශයෙන් එක් කොටසකින් ප්‍රශ්ණ **දෙකක්** වත් තෝරාගෙන ප්‍රශ්ණ **පහකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

I-කොටස- භෞතික භූගෝල විද්‍යාව

01.

i) හුණුගල් නිර්මාණය වන ප්‍රධාන ක්‍රම **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි.)

ii) හුණුගල් ප්‍රදේශයක භූගත ජලය මගින් නිර්මාණය කරන බාදිත භූරූප **තුනක්** රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iii) නිමින ග්ලැසියර් ප්‍රදේශ ආශ්‍රිතව නිර්මාණය වන බාදිත භූරූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iv) මහද්වීපික ග්ලැසියර්කරණයට ලක්වන ප්‍රදේශයක නිර්මානය වන නිධිසාදිත භූරූප **තුනක්** නිර්මාණය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු06 යි.)

02.

i) කාලගුණය හා දේශගුණය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි.)

ii) කිසියම් ස්ථානයක කාලගුණය තීරණය වීම සඳහා බලපාන පහත සඳහන් කාලගුණික මූලිකාංග පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

A - උෂ්ණත්වය හා සූර්යාලෝකය

B - පීඩනය හා සුළඟ

iii) කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයට අයත් නිවර්තන තෙත් (Af) දේශගුණ වර්ගයේ ව්‍යාප්තිය හා කැපී පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iv) ශ්‍රී ලංකාවේ දේශගුණය තීරණය වීමට බලපාන සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)

03.

i) ආපදා කළමනාකරණය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි.)

ii) ස්වභාවික ආපදා හේතුවෙන් භෞතික හා මානව පරිසරයට ඇතිවන බලපෑම් **තුනක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iii) ශ්‍රී ලංකාව තුළ සුළි සුළං ආපදාව කළමනාකරණය කරගන්නා ආකාරය ආපදා කළමනාකරණ චක්‍රයේ අවස්ථා ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 06 යි.)

iv) ආපදා කළමනාකරණයේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

04.

i) උෂ්ණත්වය පදනම් කරගෙන කාන්තාර වර්ග දෙකකට බෙදිය හැකිය. ඒවා නම් කරන්න. (ලකුණු 02 යි.)

ii) කාන්තාර බියෝමවල කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iii) වර්තමානයේදී ලෝකයේ බියෝම මුහුණදෙන ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

iv) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පහත සඳහන් සංවිධානවල ස්වභාවික පරිසර සංරක්ෂණය සඳහා වන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(අ)මධ්‍යම පරිසර අධිකාරිය

(ආ)භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

I I-කොටස- මානුෂ භූගෝල විද්‍යාව

05.

i) ජන සංක්‍රමණ යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි.)

වගු අංක 01-ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයක අභ්‍යන්තර සංක්‍රමණ-2024

දිස්ත්‍රික්කය	මුළු ජනගහනය	සංක්‍රමණික ජනගහනය		මුළු සංක්‍රමණික ජනගහනයෙන් සංක්‍රමණික ජන සංඛ්‍යා ප්‍රතිශතය
		සංඛ්‍යාව	මුළු ජනගහනයෙන් සංක්‍රමණික ජන සංඛ්‍යා ප්‍රතිශතය	
කොළඹ	2,375,415	529,233	22.3	16.7
ගම්පහ	2,436,142	530,643	21.8	16.8
ගාල්ල	1,097,372	98,067	8.9	3.1
මන්නාරම	123,756	26,952	21.8	0.8
මඩකලපුව	595,918	21,080	3.5	0.7
බදුල්ල	872,307	75,905	8.7	2.4
රත්නපුර	1,145,423	96,624	8.4	3.0
කෑගල්ල	870,476	103,479	11.9	3.3
කුරුණෑගල	1,768,156	211,489	12.0	6.7
අනුරාධපුරය	960,080	158,282	16.5	5.0
මහනුවර	1,461,895	177,304	12.1	5.6

මූලාශ්‍රය- ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්මේන්තුව

ii) ඉහත වගු අංක 1හි දත්ත ඇසුරෙන් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණවල හඳුනාගත හැකි කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

iii) බාහිර සංක්‍රමණ හේතුවෙන් ශ්‍රී ලංකාවට ඇතිවන බලපෑම් **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

iv) ජන සංඛ්‍යාවේ අවතැන්වීම නිසා ඇතිවන සමාජ ආර්ථික බලපෑම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

-උගව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව-

06.

i) කෘෂිකාර්මික තාක්ෂණික අංශයක් ලෙස ජාන තාක්ෂණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි.)

ii) ජාන තාක්ෂණයෙහි සුවිශේෂතා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iii) ලෝක කෘෂිකර්මාන්තය මුහුණ දෙන අභියෝග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)

iv) ශ්‍රී ලංකාවේ කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණය ආශ්‍රිත කැපිපෙනෙන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

07.

i) ශ්‍රී ලංකාවේ සංචාරක මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති සංචාරක කලාප **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

ii) වර්තමාන ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ වර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

iii) සාර්ක් (SAARC) සංවිධානයේ අරමුණු හා කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iv) කලාපීය සංවිධාන වර්තමානයේ මුහුණදෙන අභියෝග **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි.)

08.

i) ආකර කර්මාන්තයේදී කැණීම් සිදුකරන ආකාර දෙක නම් කරන්න. (ලකුණු 02 යි.)

ii) ලෝකයේ යපස් නිෂ්පාදනය හා වෙළඳාම ආශ්‍රිත කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

iii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ඛනිජ සම්පත් වල වැදගත්කම කරුණු **තුනක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

iv) ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් උපයෝජනයේ දී සිදුවන පරිසර හානිය අවම කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න (ලකුණු 06 යි.)

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය -2026
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2026

භූගෝල විද්‍යාව I
Geography I

22 | S | I



Past Papers Wiki

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න



ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය -2026
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2026

භූගෝල විද්‍යාව I Geography I	22	S	I	I පත්‍රය

පිළිතුරු පත්‍රය

1) **4**	11) **1**	21) **3**	31) **1**
2) **2**	12) **3**	22) **4**	32) **2**
3) **2**	13) **2**	23) **3**	33) **2**
4) **1**	14) **1**	24) **5**	34) **2**
5) **4**	15) **1**	25) **1**	35) **5**
6) **2**	16) **3**	26) **5**	36) **4**
7) **2**	17) **4**	27) **4**	37) **4**
8) **2**	18) **4**	28) **3**	38) **2**
9) **5**	19) **3**	29) **1**	39) **4**
10) **3**	20) **3**	30) **1**	40) **3**

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

-ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව-

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank